# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1991/40 - 2016 නොවැම්බර් මස 02 වැනි බදාදා - 2016.11.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/14/17/2006

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2008.11.28 දිනැති හා අංක 1577/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2008.11.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි ජාතික සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.03.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ඔක්තෝබර් මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක : IR/14/17/2006

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ජාතික සේවක සංගමය
(ඉල්ලුම්කරුවන් වෙනුවෙන්)
416, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

නඩු අංකය : ඒ - 3267 ඉල්ලුම්කරු

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

වගඋත්තරකරු

කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද

කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍ය අතාවුද සෙනවිරත්න මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

දෙපාර්ශ්වය අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වූයේ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ අවිස්සාවේල්ල ඩිපෝවට අනුයුක්තව සේවයෙහි යොදවා සිටින මෙහි පහත නම් සඳහන් සේවකයින් දාහතර (14) දෙනා හට 2004.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත සබරගමුව බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකරුගේ 2004.01.28 දිනැති ලිපිය මගින් ලබා දෙනු ලැබූ උසස්වීම් එම බස් සමාගමේ අවිස්සාවේල්ල ඩිපෝ කළමනාකරුගේ 2004.05.21 දිනැති ලිපිය මගින් අවලංගු කිරීමේ හේතුවෙන් එම සේවකයින්ට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔවුන් එකිනෙකාට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙතින් කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

ඉල්ලුම්කරුවන් පහත පරිදි වේ.

1. ඩබ්. ඒ. ජයවීර
2. ඩබ්. නිමල් ප්‍රේමසිරි
3. කේ. ඒ. ආර්. විමලසිරි
4. කේ. ඒ. ජී. පුෂ්පකුමාර
5. ජේ. එම්. නන්දසේන
6. ආර්. ගාමිණි පෙරේරා
7. ජේ. ඒ. කරුණාතිලක
8. එම්. වී. සුනිල්




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

9. ජේ. එච්. එම්. එස්. බණ්ඩාර
10. එස්. පී. චන්ද්‍රදාස
11. ආර්. ඒ. සුනිල් රත්නායක
12. එස්. ඒ. විමලදාස
13. එස්. ඩී. දයාපාල
14. එච්. ඒ. ඒ. රණසිංහ

**ප්‍රදානය**

ලිපි ගොනු අංකය : A 3267

ඉල්ලුම්කරුවන්ගේ A1 සිට A59 දක්වා ලේඛන සියල්ල කෙරෙහි මාගේ අවධානය යොමු කළ අතර, ඊට අමතරව X සිට XVIII ලෙස ඉල්ලුම්කරුවන් ඉදිරිපත් කරන ලද ලේඛන 9 ද මාගේ අවධානයට යොමු කරන ලදී. වගඋත්තරකරුවන් විසින් R1 සිට R11 දක්වා ලේඛන අදාළ නඩු විභාගයේදී ඉදිරිපත් කර ඇති අතර, එකී ලේඛන සියල්ල කෙරෙහිද මාගේ අවධානය යොමු කිරීමෙන් අනතුරුව 2009 මැයි 09 වන දින මූලික ප්‍රකාශන ගොනු කිරීමෙන් අනතුරුව මෙම නඩුවේ විභාගය ආරම්භ කරන ලදී. 2014.06.05 වන දින දක්වා විභාග කර නඩුවේ සාක්ෂි අවසන් කරන ලදී. ඉන් අනතුරුව දෙපාර්ශ්වය ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම්ද සලකා බලා පහත නිගමනවලට මා එළඹෙන ලදී.

ඉල්ලුම්කරුවන් 14 දෙනාගේ උසස්වීම් අනුව 2004 පෙබරවාරි මස වැටුපට 2004 ජනවාරි මස හිඟ මුදලද සහිතව 2004 මාර්තු දක්වා වැටුප් ගෙවා අවසන් කර තිබියදී නැවත 2004 අප්‍රියෙල් මස වැටුපෙන් පෙර ගෙවන ලද, වැටුප අඩුකිරීම හේතුවෙන් අවිස්සාවේල්ල සහකාර කොමසාරිස් තැන වෙත අදාළ ඉල්ලුම්කරුවන් පැමිණිලි කිරීමෙන් පසු දෙපාර්ශ්වය ගෙන්වා පරීක්ෂණයක් පවත්වා අදාළ කපා හැරීම් නිත්‍යානුකූල නොවන බැවින් කපා හරින ලද මුදල් හා උසස්වීම් ආපසු ලබා දී ආරවුල සමථයකට පත් කර ගන්නා ලෙසට දැනුම් දී ඇත. එහෙත් ඊට ප්‍රතිචාරයක් නොලැබුනු හෙයින් අවිස්සාවේල්ල සහකාර කම්කරු කොමසාරිස් තැන විසින් එම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුරටත් කටයුතු කිරීම සඳහා කොළඹ කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) වෙත යොමු කර ඇත. එහිදී ද දෙපාර්ශ්වය කැඳවා ආරවුල සමථයකට පත් කර ගැනීමට උපදෙස් දුන්නද එයද පිළිනොගැනීම නිසා කම්කරු කොමසාරිස් තැන විසින් මෙකී ආරවුල බේරුම්කරණයට යොමු කර ඇති අතර, ඒ 3267 නඩු අංකය යටතේ නඩුවට අදාළව ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ගරු අධිකරණයේ පෙනී සිටි ජාතික සේවක සංගමයේ නියෝජිත කරුණු ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත්ව තිබූ සබරගමුව බස් සමාගම යටතේ පාලනය වූ අවිස්සාවේල්ල ඩිපෝවේ සේවය කළ පහත නම් සඳහන් නිලධාරින් 14 දෙනාට 2004.01.21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු 2004.01.01 වන දින සිට බලපවත්වන පරිදි පිළිවෙලින් 2004.01.27, 2004.01.28, 2004.01.29 යන දින සඳහන් කොට VI ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂකවරුන් වශයෙන් උසස්වීම් ලබා දී ඇත්තේ එවකට සමාගමේ පත්වීම් නිලධාරියා වූ සේවක මණ්ඩල කළමනාකාර තැනගේ අත්සනින් යුතුවය.

ඩිපෝවේ පඩි සහාගත නොවන සනයට වැටෙන ලිපිකරුවන්ගේ හා ඩිපෝ පරීක්ෂකවරුන්ගේ වැටුප් ගෙවන්නේ සෑම මාසයකම 26 වන දින දීය. ඉහත සඳහන් උසස්වීම් ලද නිලධාරීන් 14 දෙනා ඔවුන්ට පත්වීම් ලිපි නිකුත් කරන අවස්ථාව වන විට (එනම් ජනවාරි 27, 28, 29) ජනවාරි මාසයේ වැටුප ගෙවා අවසන්ව තිබුනි. ඒ අනුව අදාළ පත්වීම් වෙනුවෙන් වැටුප් සැකසිය යුතුව තිබුණේ නව තනතුරට අදාළව 2004 පෙබරවාරි මස තුළය. ඒ අනුව මෙකී ඉල්ලුම්කරුවන් 14 දෙනාගේ පත්වීම් ලිපි අනුව 2004 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ බැවින් 2004 පෙබරවාරි මස වැටුපට ජනවාරි මස හිඟ වැටුපද එකතු කොට පෙබරවාරි මස ගෙවීම් කර ඇති බව පැහැදිලි වේ.

එමෙන්ම 2004 මාර්තු මස වැටුපද උසස්වීම් අනුව නව පඩි ක්‍රමයේ තබා ගෙවීම් කර තිබුණි. එහෙත් 2004 අප්‍රේල් මස වැටුප් ගෙවීම් කිරීමේදී ඉල්ලුම්කරුවන්ට ප්‍රදානය කර තිබූ 2004.01.01 දිනසිට ක්‍රියාත්මක වූ වැටුප නැවත 2004 අප්‍රේල් මස වැටුප් සකස් කිරීමේදී අඩුකොට නැවත පෙර සිටි ශ්‍රේණියටම අදාළ වැටුප් තලයේ තබා ගෙවීමට කටයුතු කර ඇත. එසේ හෙයින් ඒ සම්බන්ධව ගණකාධිකාරී කාර්යාලයේදී විමසූ විට ඩිපෝ කළමනාකාරතුමාගේ උපදෙස් පරිදි කර ඇති බව පෙනී යයි. නමුත් එසේ වැටුප අඩුකොට ඇත්තේ දෙන ලද උසස්වීම් අවලංගු කිරීම කිසිවෙකු විසින් සිදුකොට නොතිබියදී ය.

ඉල්ලුම්කරුවන්ට සිදුවූ අසාධාරණ ක්‍රියාව සම්බන්ධයෙන් අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත පැමිණිලි කරන ලද අතර, එම නිලධාරීන් ඩිපෝවේ නිලධාරී මහතුන් කැඳවා විභාගයක් පවත්වන ලද්දේ 2004.05.19 වන දින දීය. එහිදී හෙළි වූ කරුණු අනුව 2004 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාස වලදී නීත්‍යානුකූලව සේවකයන්ට ගෙවා ඇති වැටුප් තලය 2004 අප්‍රේල් මාසයේදී අඩුකොට ගෙවා ඇති බවත්, නීත්‍යානුකූලව ගෙවන ලද වැටුපක් පදනමකින් තොරව අඩුකල නොහැකි බැවින්, එකී සේවකයින්ට මාර්තු දක්වා ගෙවන ලද වැටුප 2004 අප්‍රේල් මස සිට ගෙවීමට කටයුතු කරන ලෙසට උපදෙස් දී ඇත.

එකී උපදෙස් පරිදි සේවක මහතුන්ට වැටුප් නොගෙවූ නිසා අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයෙන් අදාළ නඩුව කොළඹ කාර්මික සම්බන්ධතා අංශය වෙත යොමු කොට ඇත. ඒ අනුව කම්කරු සබඳතා අංශයෙන් දෙපාර්ශවය කැඳවා අදාළ හිඟ මුදල් ගෙවා ආරවුල සමථයකට පත් කර ගන්නා ලෙස කොතෙක් දැනුම් දුන්නත් ඊට එකඟත්වයක් ආයතනය නොසලකා හැර ඇති බව පැහැදිලි වේ.

ඉන් අනතුරුව අදාළ ආරවුල බේරුම්කරණය සඳහා කම්කරු සම්බන්ධතා අංශයෙන් යොමු කරන ලදී. ඒ අනුව කම්කරු සම්බන්ධතා හා මිනිස් බල අමාත්‍යාංශයේ ලේකම් තැන විසින් ගරු ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව බේරුම්කරණයන් සඳහා මා වෙත යොමු කොට ඇත. සේවක මහතුන්ට 2004.05.21 දරන ලිපියෙන් පත්වීම් අවලංගු කිරීමේ හේතුවෙන් එම සේවකයන්ට යම් අසාධාරණයක් සිදුවුයේද යන්න හා අසාධාරණයක් සිදුවුයේ නම් ඔවුන් එකිනෙකාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් කුමන සහනයන් හිමිවිය යුතු ද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙසට දැනුම් දී ඇත.

ඒ අනුව දෙපාර්ශ්වය ගරු අධිකරණයට කැඳවුනු ලදුව ඉල්ලුම්කරුවන් 14 දෙනාම එකම ආයතනයේ නිසාත්, ඇති වී ඇති ආරවුල එකම නඩු නිමිත්තක් නිසාත් ඉල්ලුම්පතේ නායකත්වය ගෙන කටයුතු කරන ලද ඩබ්. ඒ. ජයවීර ඉල්ලුම්කාර මහතා මගින් සියළු ඉල්ලුම්කරුවන්ගේ සියළුම ලේඛන ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වය එකඟ විය. ඒ අනුව ඩබ්. ඒ. ජයවීර මහතා මගින් සියළුම සේවකයන්ට අයත් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත. සලකා බැලිය යුත්තේ ඉල්ලුම්කරුවන් ඉල්ලා ඇති සහනයන් මොනවාද යන්නයි.

1. 2004.01.01 දින සිට VI ශ්‍රේණියේ උසස්වීම් යලි ක්‍රියාත්මක කිරීම
2. 2004 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මස ගෙවන ලද උසස්වීමට අදාළ වැටුප නැවත ලබා ගැනීම
3. හිඟ මුදල් ලබා ගැනීම

A6 දරන ලිපිය 2004.08.02 දින ඉල්ලුම්කරුවන් 14 දෙනාටම අත්සන් සහිතව යොමු කරන ලද්දකි.

1. A6A ඩබ්. ඒ. ජයවීර
2. A6B ඩබ්. නිමල් ප්‍රේමසිරි
3. A6C කේ. ඒ. ආර්. විමලසිරි
4. A6D කේ. ඒ. ජී. පුෂ්පකුමාර
5. A6E ජේ. එම්. නන්දසේන
6. A6F ආර්. ගාමිණි පෙරේරා
7. A6G ජේ. ඒ. කරුණාතිලක
8. A6H එම්. වී. සුනිල්
9. A6I ජේ. එච්. එම්. එස්. බණ්ඩාර
10. A6J එස්. පී. චන්ද්‍රදාස
11. A6K ආර්. ඒ. සුනිල් රත්නායක

(A6L) යූ. ඒ. චිත්‍රාමණී මැණිකේ මෙම නඩුවට අදාළ නොවූ බැව් පෙන්වා දෙමි.

ඒ වන විට විශ්‍රාම ලබා සිටින පහත සඳහන් අය සම්බන්ධයෙන් මෙකී නඩුවට අදාළව කරුණු ඉදිරිපත් කර සිටි.

ඒ අය නම් : 12. එස්. ඒ. විමලදාස
13. එස්. ඩී. දයාපාල පමණක් සාක්ෂි
14. එච්. ඒ. ඒ. රණසිංහ කැඳවා ඇත.

**ඩබ්. ඒ. ජයවීර මහතා**

මෙම ඉල්ලුම්කරු 1980.05.12 දින මණ්ඩලීය සේවයට බැඳී ඇති අතර, 1991.02.10 දින අවිස්සාවේල්ල ඩිපෝව ජනතා සන්තක ප්‍රවාහන සේවය වශයෙන් වෙනස් වූ බවත්, ඒ වන විට II ශ්‍රේණියේ රියදුරකු වශයෙන් කටයුතු කර ඇති බැවින් 1997 වසරේදී ජනතා සන්තක ප්‍රවාහන සේවය නැවත සී/ස සබරගමුව බස් සමාගම වශයෙන් නම් කර ඇති බවත් පවසා සිටී. මෙම ඉල්ලුම්කරු 2002.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි VIIIA ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂකවරයෙකු වශයෙන් උසස්වීමක් ලබා ඇත. ඉන් අනතුරුව 2004.01.28 දින දරන ලිපිය ප්‍රකාර 2004.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි VIA ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂකවරයෙකු වශයෙන් සී/ස සබරගමුව බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකාර තැනගේ අත්සනින් යුතුව උසස්වීමක් ප්‍රදානය කොට ඇත. 2004.01.28 දින වන විට 2004 ජනවාරි වැටුප සකස් කොට 2004.01.26 ගෙවා තිබූ හෙයින් 2004 පෙබරවාරි මස වැටුපට 2004 ජනවාරි මසට අදාළ හිඟ මුදලද සහිතව සකස් කොට ගෙවා ඇත. 2004 මාර්තු මස ද නව පඩිය ගෙවීම් කර ඇත. 2004 අප්‍රේල් මස වැටුපෙන් නැවත මුල් සිටි තනතුරට පහත හෙලා 2004 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මස ගෙවන ලද මුදල් කපා හැර ඇති බව පැහැදිලි වේ.

එසේ 2004 අප්‍රේල් මස VI ශ්‍රේණියට උසස්වීම පහත හෙලා පෙර සිටි ශ්‍රේණියේ වැටුප ගෙවා ඇතත් කිසිදු හේතුවක් දන්වා නැත. පසුව A3 දරන ලිපිය අවිස්සාවේල්ල ඩිපෝ කළමණාකාර තැනගේ අත්සනින් යුතුව 2004.05.21 නිකුත් කොට ඇත. සබරගමුව බස් සමාගමේ පත්වීම් බලධරයා විසින් නිකුත් කොට ඇති A2 දරන පත්වීම් ලිපිය ඊට පහළ ශ්‍රේණියක නිලධාරියෙකු වන ඩිපෝ කළමණාකාර තැනට අවලංගු කිරීමට නෛතික බලයක් නැත. හැරත් 2004.05.21 දින ලිපිය නිකුත් කළද 2004 අප්‍රේල් මස වැටුප අඩු කිරීමට කිසිදු නීතිමය හැකියාවක් නැත. මෙය හුදෙක්ම දේශපාලනමය පලිගැනීමේ අදහසින් ඩිපෝ කළමණාකාර තැනගේ තනි බලය මත සිදු කරන ලද්දක් බව සාක්ෂි සලකා බැලීමේදී පැහැදිලි වේ. කිසිදු චක්‍ර ලේඛනයකින් A4 දරන සේවක මණ්ඩල කොට්ඨාස අංක 2 දරන චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ 2004.05.07 දින දීය. එසේ නම් එකී චක්‍රලේඛය අනුව ඉල්ලුම්කරුගේ උසස්වීම් අවලංගු කිරීමේ හැකියාවක් නැත. අදාළ පත්වීම් ලිපිය ප්‍රකාර එනම් A2 2004.01.28 දින නිකුත් කරන ලද්දක් බැවින් 2004.02.07 පාර්ලිමේන්තුව විසුරුවා හරින විටත් පත්වීම් ලිපි නිකුත් කර අවසන් බැවින් එකී චක්‍රලේඛයට එය අදාළ නොවේ. ඒ අනුව මෙම වගඋත්තරකරුගේ උසස්වීම් අවලංගු කිරීම නීති විරෝධී බවත්, ඔහුගේ අහිමි කරන ලද ශ්‍රේණිය හා හිඟ වැටුප් ලබා දිය යුතු බවට නියෝග කරමි. ඇඹිලිපිටිය ඩිපෝවේ සේවක මහතුන් හයදෙනෙක් වෙනුවෙන් මේ ආකාරයට දෙන ලද උසස්වීම් අවලංගු කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් නඩුවක් ගොනු කර ඇති අතර, එහි අංකය වන්නේ SCFR ඉල්ලුම්පත් අංක 255/2004 අනුව කරුණු විමසා බලා දෙපාර්ශ්වය සමථයකට කටයුතු කර ඇත. ඒ අනුව රජයේ අධිනීතිඥ මහේන් ගොපල්ලව මහතා සභාපති ඩී. එල්. විමලසූරිය මහතා වෙත ලිපියක් යවා ඇති අතර, එම ලිපිය A643 වශයෙන් සලකුණු කර ඇත. සබරගමුව බස් සමාගමේ ප්‍රධාන කළමනාකාර (ධාවන) තැනගේ අංක සබස/නි/08 හා 2005 මාර්තු 16 දින සවස සභාපතිතුමා වෙත අදාළ නඩුව විභාගයට නොගෙන සමථයකට පත් කර ගැනීමට එකඟ වී ඇති බවත්, එනම් එකඟතාවය කොන්දේසි කරුණු 3 ක් යටතේ දක්වා ඇත. එකී කරුණු පිළිබඳව මාගේ අවධානය යොමු කරන ලදී.

තවද අවිස්සාවේල්ල ඩිපෝවේ අනුර එදිරිසිංහ මහතා විසින් ඔහුට ලබා දී තිබූ වැටුප් වැඩිවීමක් ආපසු කපා හැරීමක් හේතුවෙන් ඒ මහතා අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 92316 යටතේ නැවත නඩු පැවරීමෙන් අනතුරුව ඔහුගේ වැටුපෙන් අඩු කර තිබූ වැටුප් වර්ධක ආපසු ගෙවන ලෙසට නියෝග කොට ඇති බව මා පෙන්වා දෙන අතර, එකී නඩුවට අදාළ පිටපත් X, V වශයෙන් සලකුණු කර ඇත. එකී කරුණුද මාගේ අවධානයට යොමු කරන ලදී.

**ජේ. ඒ. කරුණාතිලක**

2004.05.07 දින බැවින් අප්‍රේල් මස වැටුප් අඩු කිරීමේ හැකියාවක් ඇති නොවේ. එය හුදෙක්ම දේශපාලන බල අධිකාරියට යටතේ ඩිපෝ කළමනාකාර තැනගේ අභිමතය පරිදි බලපෑම් කර කටයුතු කිරීමක් බව පෙන්වා දෙමි. ඒ අනුව කරුණාතිලක මහතාට 2004 ජනවාරි මස 01 දා සිට VI ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂක තනතුරට නැවත පත් කරන ලෙසටත් හා හිඟ වැටුප් ලබා දෙන ලෙසටත් කටයුතු කළ යුතු බවට නියෝග කරමි.

**කේ. ඒ. රංජිත් විමලසිරි මහතා**

2004 පෙබරවාරි මස 3705/- වැටුපක් ලැබූ බවත්, A48 සඳහන් වන අතර, රු.70/- ක වෙනසක් ලැබී ඇත. ඒ අනුව පෙර පරිදිම ඔහුට ලබා දී තිබූ උසස්වීම හා ශ්‍රේණිය හිඟ මුදල්ද සමග ලැබීමට හිමිකම ඇති බවට නියෝග කරමි.

**එස්. ඒ. විමලදාස**

2004 ජනවාරි මස රු.3470/- ක වැටුපක් ලබා ඇති බවත්, 2004 පෙබරවාරි මස ඔහුගේ වැටුප රු.4250/- වූ අතර, හිඟ මුදල වශයෙන් රු.780/- ක් ගෙවා ඇත. A19 බැගින් ද ඇති උසස්වීම් අවිස්සාවේල්ල ඩිපෝ කළමනාකාර තැන විසින් A21 දරන ලිපිය මගින් අවලංගු කර ඇති බවත්, එසේ සේවක මණ්ඩල කළමනාකාර තැන විසින් දෙන ලද උසස්වීමක් ඊට පහළ ශ්‍රේණියක ඩිපෝ කළමනාකර තැනට කිසිසේත්ම අවලංගු කිරීමේ හැකියාවක් නැත. A4 දරන චක්‍රලේඛයට අනුව කිසිසේත්ම ඔහු වැටුප් කපා හැරීම නීත්‍යානුකූල නොවේ. එසේ හෙයින් ඔහුගේ අවලංගු කරන ලද VI ශ්‍රේණියේ උසස්වීමක් කපා හරින ලද වැටුපත්, හිඟ මුදල් සමග ලැබීමට හිමිකම් ඇති බවට නියෝග කරමි.

**එච්. ඒ. ඒ. රණසිංහ මහතා**

2004 අප්‍රේල් මස නැවත A26A අනුව රු.3635/- ක පාදයේ තබා උසස්වීමෙන් දෙන ලද වෙනස අඩු කොට ඇත. එනම් පෙර පරිදිම VIII ශ්‍රේණියට පහළ දැමීමකි. නැවත ඩිපෝ කළමනාකාර තැනගේ A27 දරන 2004.05.21 දරන ලිපිය අනුව වැටුප් කපා හැර උසස්වීම් අවලංගු කර ඇතත්, එවැනි අයිතියක් ඔහුට ලැබී නැත. 2004 අප්‍රේල් මස වන විටත් ඩිපෝ කළමනාකාර තැන V ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර, ගොඩකවෙල ඩිපෝවේ සේවය කර ඇත. III ශ්‍රේණියේ නිලධාරියෙකු වූ සේවක මණ්ඩල කළමනාකාරාවරයෙකු විසින් දෙන ලද පත්වීමක් අවලංගු කිරීමට හැකියාවක් නැත. ඒ අනුව මොහුගේ උසස්වීම අවලංගු කිරීම වරදක් බවත්, ඔහුගේ අහිමි කරන ලද ශ්‍රේණිය හා හිඟ වැටුප් ලබා දිය යුතු බවට නියෝග කරමි.

**ආර්. ඒ. සුනිල් රත්නායක මහතා**

කිසිදු පදනමකින් තොරව නීත්‍යානුකූලව දෙන ලද උසස්වීමක් 5 වන ශ්‍රේණියේ ඩිපෝ කළමනාකාර තැනට අවලංගු කිරීමේ නෛතික බලයක් නැත. එසේ හෙයින් මොහුට නැවත 6 වන ශ්‍රේණියේ උසස්වීම් හා හිඟ වැටුප් ලැබිය යුතු බවට නියෝග කරමි.

**ආර්. ගාමිණි පෙරේරා මහතා**

2004.05.07 දින නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව 2004 අප්‍රේල් මස වැටුපෙන් අඩු කිරීමට කිසිදු හැකියාවක් නොමැති වුවත් ඩිපෝ කළමනාකාර තැනගේ දේශපාලන බලය මත එසේ ක්‍රියා කිරීම වැරදි ක්‍රියාවකි. ඒ අනුව මොහුගේ උසස්වීම් අවලංගු කිරීම හා වැටුප් අඩු කිරීම නීත්‍යානුකූල නොවන හෙයින් අදාළ උසස්වීම් හා වැටුප් සඳහා මෙම ඉල්ලුම්කරු හිමිකම් ලබන බවට නියෝග කරමි.

**එස්. පී. චන්ද්‍රදාස මහතා**

ගණකාධිකාරී තැනට ගෙවන ලද වැටුපක් කිසිදු පෙර දැනුම් දීමක් නොකොට වැටුපෙන් අඩු කල නොහැකිය. 2004.05.21 දාතමින් A 34 මගින් ඩිපෝ කළමනාකාර තැනට උසස්වීම් අවලංගු කිරීමේ හැකියාවද නැති බව මම නියෝග කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ උසස්වීම් අවලංගු කිරීම හා වැටුප් අඩුකිරීම වැරදි සහගත වන බැවින් අදාළ උසස්වීම් හා වැටුප් ලබා දිය යුතු බවට නියෝග කරමි.

**ජේ. එම්. නන්දසේන මහතා**

A4 දරන චක්‍රලේඛය සේ.ම.ක. විසින් නිකුත් කර ඇත්තේ 2004.05.07 දින දීය. එසේ හෙයින් ඉල්ලුම්කරුගේ වැටුප් කැපීම හා උසස්වීම් අවලංගු කිරීම නීති විරෝධී නිසා හිඟ වැටුප් හා ශ්‍රේණිය නැවත ලබා දිය යුතු බවට නියෝග කරමි.

**එච්. වී. සුනිල් මහතා**

2004.05.21 දින දරන ඒ 38 මගින් ඩිපෝ කළමනාකාර තැන විසින් ඔහුගේ අත්සනින් යුතුව ලිපියක් නිකුත් කරමින් උසස්වීම් අවලංගු කර ඇතත් එය නීත්‍යානුකූල නොවන්නේ ඩිපෝ කළමනාකාර තැන සේවක මණ්ඩල කළමනාකාර තැනට පහළ ශ්‍රේණියේ නිලධාරියෙක් කියාය. එසේ හෙයින් මෙසේ කටයුතු කිරීම නීති විරෝධී වන අතර ඉල්ලුම්කරුගේ අවලංගු කරන ලද උසස්වීම හා කපා හරින ලද වැටුප ආපසු ලැබීමට හිමිකම් ඇති බවට නියෝග කරමි.

**එස්. ඩී. දයාපාල මහතා**

2004.05.21 දරන ලිපිය අනුව උසස්වීම් අවලංගු කර ඇති බවට දන්වා ඇතත්, V ශ්‍රේණියේ ඩිපෝ කළමනාකාර තැනට III ශ්‍රේණියේ නිලධාරියෙකුගේ පත්වීම් අවලංගු කිරීමට නෛතික බලයක් නැත. එසේ හෙයින් ඉල්ලුම්කරුගේ අවලංගු කරන ලද උසස්වීම් හා කපා හරින ලද වැටුප් ආපසු ලැබිය යුතු බවට නියෝග කරමි.

**කේ. ඒ. ගාමිණි පුෂ්පකුමාර මහතා**

ඒ 42 2004.05.21 දින නිකුත් කරන විට 2004 අප්‍රේල් මස වැටුප සකස් කොට ඇත්තේ VI ශ්‍රේණියෙන් පහත හෙලා පෙර සිටි තනතුරට දමා වැටුපද අඩු කිරීමෙන් පසුවයි. එසේ නීත්‍යානුකූල නියෝගයක් නොමැතිව දෙන ලද උසස්වීමක් අහෝසි කර තිබීම නීත්‍යානුකූල නොවේ. ඒ අනුව ඉල්ලුම්කරුගේ ශ්‍රේණිය අහිමි කිරීම හා වැටුප කපා හැරීම නිත්‍යානුකූල නොවන බව පෙන්වා දෙමි. ඉල්ලුම්කරුගේ 2004 ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ වැටුප් හා උසස්වීම් ආපසු ලැබිය යුතු බවට නියෝග කරමි.

**ඩබ්. නිමල් ප්‍රේමසිරි මහතා**

2004.05.21 දින (ඒ 59) සහිතව ඩිපෝ කළමනාකාර තැනගේ අත්සනින් යුතුව උසස්වීම් අවලංගු කරන බව දන්වමින් ලිපියක් නිකුත් කොට ඇත. එසේ ලිපිය නිකුත් කිරීම ඩිපෝ කළමනාකාර තැනට කළ නොහැක. එසේ හෙයින් මෙම ඉල්ලුම්කරුගේ උසස්වීම අවලංගු කිරීමට නිත්‍යානුකූල අයිතියක් නොමැති බැවින් වැටුප් හා උසස්වීම් ලැබිය යුතු බවට නියෝග කරමි.

**ජේ. එච්. එම්. එස්. බණ්ඩාර මහතා**

අවිස්සාවේල්ල ඩිපෝ කළමනාකාර තැනගේ 2004.05.21 දින දරන ලිපිය මගින් (එක්ස් 03 ලෙස ලකුණු කරන ලද) ලේඛනය මගින් VI ශ්‍රේණියේ පත්වීම් අවලංගු කර දමා ඇතත් එය නිත්‍යානුකූල නොවන බැවින් අහිමි කළ වැටුප් හා උසස්වීම් ඉල්ලුම්කරුට හිමිවිය යුතු බවට නියෝග කරමි.

විශේෂයෙන් සලකා බැලිය යුතු වන්නේ මේ ආරවුල සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනය වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගයයි. වගඋත්තරකාර සේවා යෝජක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද පිළිතුරු ප්‍රකාශය පරිදිද දන්වා ඇත්තේ 2004.01.01 දින

සිට ක්‍රියාත්මක වන පරිදි සී/ස සබරගමුව බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකාර තැනගේ 2004.01.27, 28 දිනැති ලිපි මගින් සේවකයින් 14 දෙනෙකුට උසස්වීම් ලබාදී ඇති බවත් එම උසස්වීම් සමාගමේ අවිස්සාවේල්ල ඩිපෝ කළමනාකරුගේ 2004.05.21 දිනැති ලිපිය මගින් අවලංගු කිරීමේ හේතුවෙන් එම සේවකයින්ට යම් අසාධාරණයක් සිදුවී ඇති බව පැහැදිලිව දක්වා ඇත. මෙහිදී එම ආරවුල කුමක්ද යන්න සරල වශයෙන් ගතහොත් 2004 ජනවාරි මස නිකුත් කර ඇති පත්වීම් ලිපි 14 මගින් 2004.01.01 දින සිට බලපවත්වන පරිදි VI ශ්‍රේණියට උසස් කර ඇති බවත්, 2004 ජනවාරි මස හිඟ වැටුප පෙබරවාරි මස වැටුපට එකතුකර ගෙවා ඇති බවත් මාර්තු වැටුපද එලෙසටම ගෙවා ඇති බවත් නමුත් අප්‍රේල් මස 26 දින වැටුප් ගෙවීමේදී අදාළ සේවකයින් 14 දෙනා 2004 ජනවාරි මස ලැබූ පඩි පාදයට (එනම් 2004.01.01 ක්‍රියාත්මක උසස් වීමට පෙර) පහත හෙලා ගෙවීම් කර ඇති බවත් එහෙත් උසස්වීම් අවලංගු කිරීමේ ලිපි 2004.05.21 දින අවිස්සාවේල්ල ඩිපෝ කළමනාකාර තැන විසින් නිකුත් කර ඇති බවත්, ගෙවන ලද වැටුපක් කිසිදු හේතුවක් නොමැතිව විධිමත් ක්‍රියා මාර්ගයකින් තොරව අඩු කිරීම නිත්‍යානුකූල නොවන බව පැහැදිලි වේ. ඒ අනුව මෙම සේවක මහතුන් 14 දෙනාට හෙලි වී ඇති කරුණු අනුව 2004 ජනවාරි 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද අනුමැතියෙන් පසු අදාළ 14 දෙනාට 2004.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙලින් 2004.01.27, 28 හා 29 යන දිනයන් හි පත්වීම් ලිපි බලයලත් නිලධාරී වන සේවක මණ්ඩල කළමනාකාර තැන විසින් නිකුත් කර තිබියදී එය අවලංගු කිරීම නිත්‍යානුකූල ද යන්න වගඋත්තරකාර සමාගම විසින් තහවුරු කළ යුතු යි. ආරවුලේ මූලික හරය එයයි. දැන් විමසා බැලිය යුත්තේ වගඋත්තරකාර ආයතනය විසින් එම කාර්යය සිදු කර ඇත්ද යන්න සොයා බැලීමයි. වගඋත්තරකාර පාර්ශ්වය සාධාරණ ලෙස ක්‍රියා කිරීමට අපොහොසත් වී ඇති බව පැහැදිලිය.

තවදුරටත් පවසන්නේ නම් අදාළ උසස්වීම් සියල්ලම සබරගමුව බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකාර තැන අත්සන් තබා ඇත. 2004 පෙබරවාරි මස ජනවාරි මස හිඟ වැටුපද ගෙවා ඇති අතර, මාර්තු මස වැටුපද ගෙවීමෙන් පසු 2004 අප්‍රේල් මස නැවත වැටුප අඩුකොට ඇත. 2004 අප්‍රේල් මස, උසස්වීම් වශයෙන් ගෙවන ලද වැටුප් හා ශ්‍රේණිය අවලංගු කර ඇත්තේ 2004 අප්‍රේල් මස තුළදීය. ඊට කිසිදු නීත්‍යානුකූල උපදෙසක් නැත. උසස්වීම් අවලංගු කර ඇත්තේ 2004.05.21 දිනැති අවිස්සාවේල්ල ඩිපෝ කළමනාකාර තැනගේ අත්සන සහිතව නිකුත් කර ඇති ලිපි මගිනි. එය එසේ කිරීමට කිසිදු නීතිමය පදනමක් නොමැති බව මා දන්වා සිටිමි.

2004.01.01 දින සිට ශ්‍රේණියේ උසස්වීම් යලි ක්‍රියාත්මක කළ යුතු බවට නියෝග කරමි.

2004 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මස ගෙවන ලද උසස් වීමට අදාළ වැටුප නැවත ලබා දීමට ද හිඟ මුදල් ලබා දීමටද නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී මාස දෙකක් ඇතුළත ඉල්ලීම ක්‍රියාත්මක විය යුතු බවද ප්‍රකාශ කරමි.

එය සාධාරණ හා යුක්ති සහගත යැයි මාගේ හැඟීම හෙයින් ඒ අනුව මාගේ ප්‍රදානය මෙසේ නිකුත් කරමි.

නීතිඥ කේ. ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු,
බේරුම්කරු,
කාර්මික අධිකරණය.

2015 මාර්තු මස 10 දින දී ය.

11 - 851

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.